04 ඒකකය - සාධක හා ගුණාකාර(3)

- **පූර්ණ සංඛ්‍යාවක් ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙසින් ලිවීම**

නිදසුන 01.	**නිදසුන 02.**
24 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙසින් ලියන්න.	150 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙසින් ලියන්න.
24 හි ප්‍රථමක සාධක 2 හා 3 වේ.	150 හි ප්‍රථමක සාධක 2,3,5 වේ.
2 | 24 2 | 12 2 | 6 3 | 3 1	2 | 150 3 | 75 5 | 25 5 | 5 1
$\therefore 24 = 2 \times 2 \times 2 \times 3$	$\therefore 150 = 2 \times 3 \times 5 \times 5$

01. පහත දැක්වෙන සංඛ්‍යා ප්‍රථමක සාධකවල ගුණිතයන් ලෙසින් ලියන්න.

i 18 ii 30 iii 45 iv 200 v 90

- **<u>ප්‍රථමක සාධක ඇසුරෙන් සංඛ්‍යාවක සාධක ලබා ගැනීම</u>**
  - 7 ශ්‍රේණිය ගණිතය පෙළ පොත අංක 1 හා පිටු අංක 37 යටතේ ඇති **ප්‍රථමක සාධක ඇසුරෙන් සංඛ්‍යාවක සාධක ලබා ගැනීම** යන පාඩම් කොටස හොඳින් අධ්‍යයනය කරන්න.

නිදසුන

$30 = 2 \times 3 \times 5$ $\quad$ 2×15

$30 = 2 \times 3 \times 5$ $\quad$ 6×5

$30 = 2 \times 3 \times 5$ $\quad$ 10×3

$\therefore$ 30 හි සාධක 2, 6, 10, 15, 5, 3 සහ 1, 30

අනිවාර්ය සාධක

ප්‍රථමක සාධක යුගල් කර ගුණ කිරීමෙන් ලබාගත් සාධක

මෙම සාධක පිළිවෙළට ලියූවිට, 1, 2, 3, 5, 6, 10, 15, 30

02. පහත දැක්වෙන එක් එක් සංඛ්‍යාවේ සාධක ඒවායේ ප්‍රථමක සාධක ඇසුරෙන් සොයන්න.

i 18 ii 45 iii 50 iv 90 v 60

➢ **ඔබේ ගණිතය පෙළ පොතෙහි 4.3, 4.4, 4.5 යන අභ්‍යාස සම්පූර්ණ කරන්න.**